සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වයඹ මාගාණ කල්වික් තිණෛක්කළම් Department of Provincial Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 21 S I,II

නම: .............................................

**සිංහල භාෂාව හා සාහිත්‍යය i**

කාලය පැය තුනයි

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. දෙපිළ ම ආරම්භයේ පටන් **කරට කර** තරග කළ බව මිතුරා පැවසුවේ ය.
   1. අත් බැඳගෙන  2. එකිනෙකට දෙවනි නොවන
   3. කර මත අත තබා  4. අතට අත දෙමින්

02. ගම් ප්‍රධානියාගේ **<u>උකුසු ඇස්</u>** එම ක්‍රියාව දෙසට යොමු විය.
   1. තියුණු විමසුම  2. භයානක ප්‍රතිචාර  3. රහසිගත සෙවීම්  4. දැඩි නීති

03. **<u>අත යටින්</u>** කරන ගනුදෙනු නිසා ඔහුගේ තනතුර අහිමි විය.
   1. අවිධිමත් අයවැය  2. අක්‍රමවත් මුදල් ගනුදෙනු.
   3. කළමනාකරණයෙන් තොර  4. මුදල් වංචා

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. වාච්‍යාර්ථය ඉක්මවා ..................... ජනනය කෙරෙන ආකාරයට කවියා බස හසුරුවයි.
   1. අතිශයෝක්තිය  2. ස්වභාවෝක්තිය  3. නිශ්චිතාර්ථය  4. ව්‍යංග්‍යාර්ථය

05. දළදා පෙරහැර ආගම් අතර ..................... වර්ධනය කරන කලා මංගල්‍යයකි.
   1. සහජීවනය  2. සමරූපිතාව  3. අභිවෘද්ධිය  4. යාවත්කාලීන බව

06. අධික උණුසුම නිසා සිරුර සූර්යාලෝකයට .................... වීම අවම කර ගත යුතුය
   1. ආවරණය  2. ආකර්ෂණය  3. නිරාවරණය  4. සම්බන්ධ

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. මාලිගාව, නිශ්ඵල, කල්‍යාණ, තාරුණ්‍යය  2. ප්‍රාදේශික, අල්පේච්ච, විශේෂතා, පාපිෂ්ඨ
   3. ඓක්‍යය, ඉහලින්, ක්‍රමානුකුල, පශ්චාත්තාප  4. සම්භාෂණ, කාලගුණය, සංශෝධනය, ශිලාලේඛන

08. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
   1. ඉවසීම, කාරුණික, ආදරය, සෙනෙහස  2. ධාර්මික, විශ්වාසය, අවංක, නිසැක
   3. ආලෝකය, කාන්තිය, රමණීය, සුන්දරත්වය  4. පියල්, බිනර, සංජය, රුවන්

09. සැකය, විනය, තෘෂ්ණාව, රූපය යන පදවල පළමු අක්ෂරයෙහි ඇති පිල්ලම අනුපිළිවෙළින් නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.
   1. ඇලපිල්ල, ඉස්පිල්ල, ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල.
   2. ඇදපිල්ල, ඉස්පිල්ල, ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝ ඇදය
   3. ඇදපිල්ල, ඉස්පිල්ල, ගයනුකිත්ත, දීර්ඝ පාපිල්ල
   4. ඇදපිල්ල, ඉස්පිල්ල, ගැට ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල

10. ''අමතනු'' යන පදයේ ඇති ව්‍යඤ්ජනාක්ෂර වර්ග වනුයේ,
   1. කණ්ඨජ, ඕෂ්ඨජ, දන්තජ ය.  2. මූර්ධජ ඕෂ්ඨජ, තාලුජ ය.
   3. මූර්ධජ, ඕෂ්ඨජ, දන්තජ ය.  4. දන්තජ, කණ්ඨජ, තාලුජ ය.

11. අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1. සත්තු, මොවුන්, දරුවෙක්, තරුණියක
   2. ලේඛකයන්, ගොවියෙකු, තා, ඔවුන්
   3. මා, පක්ෂීහු, හෙදියක, උගත්තු
   4. ගංගාවෝ, නාවිකයෙකු, ධනවතෙකු, තරඹන්නන්

12. ජයග්‍රහණය ලැබූ දරුවාගේ මුහුණ සතුටින් පිරී ගියේ ය. යන වාක්‍යයෙහි ''දරුවාගේ'' යන පදය අයත් විභක්ති වර්ගය කුමක් ද?
   1. ආධාර
   2. සම්බන්ධ
   3. අවධි
   4. ප්‍රථමා

13. ''රන්රුව'' යන්න අයත් වන්නේ,
   1. විශේෂණ සමාසයට ය.
   2. දකාරාර්ථ සමාසයට ය.
   3. අන්‍යාර්ථ සමාසයට ය.
   4. විභක්ති සමාසයට ය.

14. සිද්ධාන්ත + ඉක යන ප්‍රකෘති හා ප්‍රත්‍ය එක් වීමෙන් සකස්වන පදය දැක්වෙන වරණය තෝරන්න.
   1. සිද්ධාන්තික,
   2. සෛද්ධාන්තික
   3. සිද්ධන්තික
   4. සෙද්ධන්තික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
   1. පූර්ව ක්‍රියා - දමා, කළ, සෝදා, දී
   2. කෘදන්ත - දරන, කරන, සදන, ලියන
   3. ආගම සන්ධිය - දෙයාකාර, වියවුල, දෙවුර, නිරුදක
   4. විශේෂණ සමාසය - නිල්දිය, ගල්හිත, පුන්සඳ, උස්පවුර

16. මිශ්‍ර ක්‍රියා පදයක් යෙදී ඇති වාක්‍ය කුමක් ද?
   1. දරුවා වහා නිවසට ගොස් මව හමුවිය.
   2. ළමයි රස කර කර කෑම කති.
   3. විදේශිකයෙක් මිල ගණන් විමසා භාණ්ඩ ගනියි.
   4. ඔහු යද්දී අයියා ගණිත ගැටලුව විසඳා තිබුණි.

**අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

17. එම **චිත්තාකර්ෂණීය** සිතුවම දෙස සැවොම බලා සිටියහ.
   1. භයානක
   2. පුදුම උපදවන
   3. සිත් ඇදගන්නා
   4. පැහැපත්

18. සාකච්ඡාව අවසානයේ **සම්මුතියකට** එළඹීම දුෂ්කර විය.
   1. විරෝධතාවයකට
   2. සාමදානයට
   3. මතගැටුමකට
   4. එකඟතාවයකට

19. එම ශිල්පියාගේ **හසළත්වය** නිර්මාණය තුළින් පිළිබිඹු විය.
   1. මැනවින් පුරුදු පුහුණු කළ බව
   2. අදාළ ලෙස යොදන බව
   3. විශ්වාසය රැඳුණු බව
   4. හැකියාව

20. පහත වචන ගොනු අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවතින පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   1. උපමා, රූපක, සංකේත, ඉඟිවැකි
   2. දොර, ජනේලය, පියගැට පෙළ, වහලය
   3. රළ පනාව, බිසෝකොටුව, පිටවාන, සොරොව්ව
   4. ගයනුකිත්ත, අක්ෂරය, පාපිල්ල, කොම්බුව

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණ ඇතුළත් වර්ණය තෝරන්න.
   1. ගල් - පහණ, වනය - වල, ප්‍රඥාව - නුවන, රජ - රද
   2. ලිය - මහිලාව, නෙළුම් - කමල, උචිත - යෝග්‍ය, ජලය - අඹ
   3. කොණ්ඩය - මුහුළ, මුහුදු - සිඳු, රත්රන් - රුවන්, ප්‍රසිද්ධ - පතල
   4. කනගාටුව - සොම්නස, බඩගින්න - ක්ෂුදාව, සරණ - පිහිට, පොත - ග්‍රන්ථය

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1. පක්ෂි - විහඟ, කුරුලු, දද, සියොත්
   2. අනංගයා - මලවි, මල්සර, මනයොන්, මදරද
   3. පොළොව - පෘථිවිය, දෙරණ, මිහිකත, අඹර
   4. ශක්‍රයා - විදුරවි, පුරරඳ, සක්, සහසැස

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
   1. උත්සහය - නිරුත්සාහය
   2. බහුල - විරල
   3. ආයාසය - නිරායාසය
   4. යෝග්‍ය - ඖචිත්‍ය

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
   1. ජ් + ඤ අකුරු දෙක සම් මිශ්‍රණයෙන් ''ඥ'' බැඳි අක්ෂරය සැකසී ඇත.
   2. ''ලුහු ස්වර යනු ගුරු ස්වරවලට කියන තවත් නාමයකි.
   3. නාසික්‍ය අක්ෂරවලට අනුනාසික්‍ය යන නමද භාවිතා කරයි.
   4. වර්ගාක්ෂරවලට අයත් මුළු අක්ෂර ගණන 25 කි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමකින් යුක්ත, අර්ථාන්විත වාක්‍ය තෝරන්න.
   1. සෙල්ලිපි යනුවෙන් හැඳින්වෙන්නේ ගලේ කෙටූ ලියවිල්ලකි.
   2. ගිරිලිපි ගල් පර්වතවල කොටන ලද ලිපි නමින් හැඳින් වේ.
   3. දෙවන පෑතිස් ඉතිහාසය අවධිය දක්වා මෙරට සෙල්ලිපි විහිදෙයි.
   4. බ්‍රාහ්මී අක්ෂරවල ආදී ම සංකේත සිංහල අකුරු බව පැහැදිලි ය.

- අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. ස්ථිර ප්‍රතිපත්තියක් නැත්තා පිරිහීමට ලක් වේ.
   1. අතු කඩා මොර කන්නා සේ.
   2. ඉබි කටුත් බේතට ඕනෑ වේ.
   3. අත්තෙන් අත්තට පනින කුරුල්ලා තෙමී නසී.
   4. ඔළිඳ ඇටේනුත් ඇහැ කණ වෙනවා.

27. නිෂ්ප්‍රයෝජන දෙයක් අනුන් ට දීම.
   1. බාගෙන කන්න තිබුණ වළ ඉහගෙන කෑම.
   2. දෙබරේ බැන්ද ගහ පිනට ඇරියා වගේ.
   3. ගැරඬින් පෙනේ කරන්නට හදනවා වගේ.
   4. අටුවෙන් දුමට පැන්නා වගේ.

28. ස්වර සන්ධියට හා ස්වරාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   1. දෑත, නිලුපුල්
   2. නිලුපුල්, පැහැති
   3. පැහැති, දෑත
   4. නිලුපුල්, දෑත

- අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. 1. අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
   2. මම එය කියවා ඇත්තෙමි.
   3. ඕ තොමෝ ගමට ගියහ.
   4. ඔහු හෙවත් මම ඊට සහභාගී වෙමි.

30. 1. පිට්ටනියේ ළමයි ඇත.
   2. ඔවුහු ක්‍රීඩා කරති'යි අපි සිතුවෙමු.
   3. ළමයි සමඟ ගුරුතුමිය කවි කීවාය.
   4. ඔවුන් ක්‍රීඩකයෝ වෙති.

31. • නිලධාරිහු සේවකයන් ................. සාකච්ඡා කළහ.
   • ඔහු එළවළු ................. මස් ආහාරයට නොගනී.
   • තදබල අසනීපයක් ............... මම සේවයට නොගියේ ය.
   • ඈ පියුමක් ............... මුව විහිදා සිනාසුනා ය.

   ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
   1. සමඟ, විනා, නිසා, බඳු
   2. විනා, සමඟ, නිසා, බඳු
   3. සමඟ, නිසා, විනා, බඳු
   4. බඳු, සමඟ, විනා, නිසා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
   "ඔවුහු එනකොට අපි ඇවිත් හිටියා"
   1. ඔවුහු එද්දී අපි පැමිණ සිටියෙමු.
   2. ඔවුන් එද්දී අපි පැමිණ සිටියහ.
   3. ඔවුන් පැමිණෙන විට අපි පැමිණ සිටියෙමු.
   4. අපි එනවිට ඔවුහු පැමිණ සිටියහ.

33. "සෙංකොට්ටං" නවකතාවේ රචකයා වනුයේ,
   1. ගී ද මෝපසං ය.
   2. ගුණදාස අමරසේකර මහතා ය.
   3. මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතාය.
   4. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

34. පහත කවියේ තුන් වන පදය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

'' හබලට ඔබේ සවිබල අත රිදෙනවද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ නගිනවද
............................................................................
හිමියනි වෙහෙස නිදිමත දෙක දැනෙනවද

1. මේ රුදු සුළං රැළි රළ පිට නැගෙනනව ද
2. පැද යන ඔරුව වෙත මසුකැල වැදෙනව ද
3. ගෙරවිලි සහිත විදුලිය හඬ ඇසෙනව ද
4. සීතල සුළඟ රැළවට ඇඟ වැදෙනව ද

35. ''සබවස කුලුණු මෙත් මුදිතා දහම් සැම'' මෙහි **සබවස** යන්නෙහි තේරුම වනුයේ,

1. මෛත්‍රිය 2. සත්‍ය වචන 3. වැරදි වචන 4. කැලෑව

36. පහත කවියේ ඇති කාව්‍යාලංකාරය කුමක් ද?

'' කතා බහෙන් සිනාසෙමින්
ජීවිතයේ ගිරි දුර්ගය
නගින
ගැහැනිය ඔබ

1. රූපක 2. උපමා 3. අනුප්‍රාසය 4. ස්වාභාවෝක්තිය

37. ශ්‍රී පාද වන්දනාවේ දී ''ගඟුල බානවා'' යැයි ප්‍රකාශ කළේ කුමකට ද?

1. නානවා 2. මාළු අල්ලනවා 3. නිදා ගන්නවා 4. වැස්ස වහිනවා

38. පහත නිර්මාණවල රචකයින් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

**හංස සංදේශය, කාව්‍යශේඛරය, සුනේත්‍රා, හුනුවටේ කතාව**

1. හෙන්රි ජයසේන මහතා, තොටගමුවේ රාහුල හිමි, ඩබ්. ඒ. සිල්වා, වීදාගම මෛත්‍රී හිමි.
2. වීදාගම මෛත්‍රී හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, හෙන්රි ජයසේන මහතා, ඩබ්.ඒ. සිල්වා මහතා
3. වීදාගම මෛත්‍රී හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, ඩබ්. ඒ. සිල්වා මහතා, හෙන්රි ජයසේන
4. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රී හිමි, ඩබ්. ඒ. සිල්වා මහතා, හෙන්රි ජයසේන

39. හුනුවටයේ කතාවේ ඇතුළත් චරිතයක් නොවේ.

1. අසඩක් 2. ගෲෂා 3. මහේන්ද්‍ර 4. නටාලියා

40. පහත සඳහන් වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වාක්‍යය තෝරන්න.

''උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය යනු වාක්‍යයක උක්තය හෙවත් ක්‍රියාව සිදු කරන්නා අඟවන නාමපදයත් ආඛ්‍යාතය හෙවත් එම නාම පදයෙන් දැක්වෙන කර්තෘ විසින් සිදු කරනු ලබන ක්‍රියාවත් අතර පැවතිය යුතු ව්‍යාකරණමය ගැළපීමයි.

1. උක්ත ආඛ්‍යාත සම්බන්ධ යනු උක්තයට අනුව ක්‍රියා පදය තැබීමයි.
2. උක්තය හෙවත් ක්‍රියාව සිදු කරන්නා අඟවන නාම පදයත් ආඛ්‍යාතය නැතහොත් එම නාම පදයෙන් දැක්වෙන කර්තෘ විසින් කරනු ලබන ක්‍රියාවත් අතර ව්‍යාකරණමය ගැළපීම උක්ත ආඛ්‍යාතය පද සම්බන්ධයයි.
3. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය යනු ක්‍රියාව කරන්නාත් අදාල ක්‍රියාවත් අතර එකිනෙකට ගැළපෙන සේ පද සම්බන්ධ කිරීමයි.
4. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය යනු වාක්‍යයක උක්තයක් ආඛ්‍යාතය හෙවත් එම නාම පදයෙන් දැක්වෙන ක්‍රියාවත් අතර පද ගැළපීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 21 S II

නම: ............................................ **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය දෙකයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

★ අංක (I) සිට (X) දක්වා ඇති සියලු ම ප්‍රශ්න සඳහා කෙටි පිළිතුර ලියන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක සඳහා අදාළ අක්ෂරය බැගින් ලියන්න.
(අ) සංයුක්ත ස්වර -
(ආ) දීර්ඝ ස්වර -

ii. පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.
(අ) නිදාන -
(ආ) නිධාන -

iii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
- සිංහල සහ දෙමළ ජාතීහු සූර්‍යයා මීන රාශියෙන් මේෂ රාශියට ගමන් කිරීම අළුත් අවුරුද්ද ලෙස සලකනු ලබති.

iv. පහත සඳහන් පද විසන්ධි කොට අයත් සන්ධි නම් කරන්න.
(අ) කොග්ගල.
(ආ) ඔවුනොවුන්.

v. විරුද්ධ පද ලියන්න.
(අ) සංකෝචනය -
(ආ) පරාධීන -

vi. පහත වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) මිනිස්සු අපට දොස් කියති'යි. මව පැවසුවා ය.
(ආ) ගුරුතුමිය ශිෂ්‍යාවෝ සමඟ ක්‍රීඩාංගණයට ගියා ය.

vii. පහත වාක්‍යයේ ඇති උපසර්ග පදයක් හා නිපාත පදයක් තෝරා ලියන්න.
අතිදක්ෂ වෛද්‍යවරුන් රට හැර යන බැවින් රජය ඒ සඳහා පියවර නොගැනීම ඉමහත් ගැටලුවකි.

viii. පහත වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය නම් කරන්න.
(අ) <u>කුරව</u> පියාසර සකි කොන්ත නම් තොටින්.
(ආ) ගෙවිලිය ගොයම් <u>කපද්දී</u> ගොවියා කමතට ගියේ ය.

ix. පහත වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) සතුරන් විසින් අපි පීඩාවට පත් කරනු ලැබුවෙමු.
(ආ) ප්‍රචණ්ඩව හැසිරුණු දේශපාලනඥයන් විසින් මෙවර ඡන්දය පරාද වන ලදී.

x. පහත සත්කෝරළයේ ව්‍යවහාර වචන සඳහා ගැළපෙන සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින වචනය ලියන්න.
(අ) වයිතාලය.
(ආ) කුඩ හලුවා.

02. පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර වලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

අ) ශ්‍රී ලංකාව ඇතුළු ආසියාකරයේ රටවල ජීවත්වන වැඩිහිටි ජනගහනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. එසේ ම වර්තමානයේ පවතින ආර්ථික අර්බුද, සමාජීය පරිවර්තනය, ජීවන වියදම ඉහළ යෑම, පවුලේ සාමාජික සංඛ්‍යාව අඩුවීම, නාගරීකරණය වැනි හේතු මත ස්වකීයයන්ගෙන් දුරස් වන වැඩිහිටියන් දැඩි අසරණභාවයට පත්ව ඇත. වැඩිහිටි නිවාස ගත්තද වර්තමානයේ ඒවා බොහෝමයක් ප්‍රමිතියෙන් තොර ය. මේ නිසා වැඩිහිටියන් ආදරයෙන්, කරුණාවෙන් රැක බලා ගත හැකි ක්‍රමවේදයක් සැකසීම කඩිනම් කළ යුතු ය.

ආ) වර්තමාන සමාජ සංකීර්ණත්වය හමුවේ එදිනෙදා ජීවිතයේ කටයුතු පහසු කර ගැනීම උදෙසා මිනිසුන් තම ආහාරවේල ක්ෂණික ආහාර වේලකින් තෘප්ත කර ගැනීමට පෙළඹී ඇත. අතීත ශ්‍රී ලාංකිකයා භාවිත කළ ආහාර වේල නිසා ඔවුහු ඉතා සෞඛ්‍ය සම්පන්නව ජීවත් වුවද ක්ෂණික ආහාර වර්ග ජනයාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර ය. විවිධ ආකාරයේ බෝ නොවන රෝගාබාධවලට මේ නිසා ජනතාව ඉතා ශීඝ්‍රයෙන් ගොදුරු වෙමින් පවතී. ඉන් මුදවා ගත යුතුය.

ඉ) දියුණු ගත සාහිත්‍යයක් අප රට තුළ පැවති බවට සීගිරි ගී සාක්ෂි සපයන අතර ජන කවියට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. සාමූහික නිර්මාණ විශේෂය වුව ද මෙයින් ගැමි දිවිය අපූර්ව ආකාරයෙන් මතු කර පෙන්වයි. අව්‍යාජත්වය, මනා සංයමය පැරණි නිර්මාණ තුළ දැකිය හැක. නමුත් නූතන ගීත සාහිත්‍යය මෙන් ම නව පරපුරේ රසඥතාව ද පිරිහී ඇත. මේ පිළිබඳ සෙවිය යුතු කාලය එළඹ ඇත.

ඊ) ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයේ ඇති ගැටලු සහගත තත්වය හේතු කරගෙන දේශීය වෛද්‍ය ක්‍රමය කෙරෙහි මේ වන විට නැඹුරුතාවය වැඩිවෙමින් පවතියි. විෂ වෛද්‍ය ක්‍රමය, කැඩුම් බිඳුම් වෙදකම පමණක් නොව සෑම ක්ෂේත්‍රයේ කෙරෙහි ම මේ වන විට විශ්වාසය තහවුරු වෙමින් පවතියි. ඒ නිසා නවීන විද්‍යාවේ දියුණු ක්‍රමවේද ඔස්සේ දේශීය වෛද්‍ය ක්‍රමය නඟා සිටුවීම උචිත ය.

03. පහත දැක්වෙන පාඨය වචන 50-55 වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව ද සාරාංශයේ අග ලියන්න.

භාෂාවේ අගය වැඩිවන්නේ එය නිවැරදි ව හා රසවත් ව යොදා ගැනීමෙනි. නිවැරදි ව භාවිතා කිරීමට නම් භාෂාව සම්මත රීතිවලට අනුව නිවැරදි ව පරිහරණය කළ යුතු වේ. සාවද්‍ය යෙදුම් සහිත ව භාෂාව යොදා ගැනීමෙන් පවසන අදහස අවුල් සහගත වන අතර අසන්නාට හෝ කියවන්නාට යමක් මනාව තේරුම් ගත නොහැකි, අරුත් සුන් ප්‍රලාප බවට පත්වනු ඇත. ඒ නිසා භාෂාව නිවැරදි ව භාවිත කිරීමෙන් එහි අගය වැඩිවන්නා සේ ම භාෂාවේ වර්ධනයටත් හේතු වන්නේ ය. නිවැරදි භාෂා භාවිතය උදෙසා කරුණු කීපයක් හේතු වේ. මින් එකක් වනුයේ අප උච්චාරණය කරන භාෂණ ශබ්ද ලියා දැක්වීම සඳහා අවශ්‍ය වන අකුරු ය. අකුරු නිසි ආකාරයට ලිවීමත්, අදාළ තැන නිසි අකුරු යෙදීමත් මගින් නිවැරදි අක්ෂර භාවිතය ඇතිවේ. අකුරු ඇතුළත් කොට ලියනු ලබන වචන හෙවත් පද අප භාෂා ව්‍යවහාරයන්ගෙන් තොරව ලිවිය යුතු වේ. එමෙන් ම වචනයට අර්ථය ද නිසිතැන නිවැරදි ව අර්ථවත් වන අයුරින් භාවිත කළ යුතු ය.

යම් පදයක අකුරු නිවැරදි ව ලිවීම නිවැරදි අක්ෂර වින්‍යාසය නම් වේ. යම් වාක්‍යයක් ව්‍යාකරණානුකූල ව, නිර්මාණාත්මක ව ලියා තිබුණ ද එහි අක්ෂර වින්‍යාසය වැරදි නම් එම වාක්‍ය නිවැරදි සේ පිළිගත නොහැකි ය. ඒ අනුව යම් ලේඛනයක තිබිය යුතු වැදගත් ගුණාංගයක් මෙන් ම ලක්ෂණයක් ලෙස අක්ෂර වින්‍යාසය හඳුන්වා දිය හැකි ය.

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඕනෑම රටක ගීත කලාවක් තිබීම මගින් එහි සංස්කෘතියේ ශිෂ්ට සම්පන්නභාවයත්, උදාර සාහිත්‍යමය ලක්ෂණත් ගම්‍ය වේ. තවත් විටෙක සාමූහික කලාවකි. ගී පද රචකයා තනු නිර්මාණකරුවා ගායකයා හෝ ගායිකාව යන ත්‍රිත්වයේ මූලිකත්වයෙන් ගීතයක් බිහි වේ. එනිසා එය සාමූහික කලාවක් යැයි පවසන්නේ තමා විඳින්නා වූ ප්‍රස්තුතය බසෙහි ශබ්ද හා අර්ථ මාධූර්යයෙන් ප්‍රමුදිත කොට කාව්‍ය සංකල්පනාවන්ගෙන් පුරවා දෙන්නේ ගී පද රචකයා ය. එයට නිර්මාණකරුවා තාලයක් මවා දෙයි. ගායකයා හෝ ගායිකාව හෝ එය ගයයි. මෙකී ත්‍රිත්ව නිර්මාණ ශක්තිය සාර්ථක ගීතයකට පදනම සපයයි.

ගීතය යථාර්ථවත් සාහිත්‍යමය රචනයකි. එය සහෘද හද සියුම් ලෙස ස්පර්ශ කොට ප්‍රබල වින්දනයක් ලබාදෙන සාහිත්‍යකලාවක් බවට අද්‍යතනයේ පත් ව ඇත. මේ අනුව ගීතය දෙස තවදුරටත් විමංසනාක්ෂියෙන් බලන කල පෙනී යන්නේ එය සහෘද හද කාව්‍යමය භාෂණයක් ද වන වගයි. සිංහලයේ පැරණිතම ගී වන්නේ ජන ගී

ය. වන්නම් විරුදු යනාදිය අතීතයේ දක්නට ලැබිණි. පසුව පෘතුගීසීන් නිසා බයිලා, කැරොල් වැනි ගීත ද මෙරට ගීත උතුරු ඉන්දියාවෙන් නූර්ති ගීත ද, දකුණු ඉන්දියාවෙන් නාඩගම් වැනි ගීත ද මෙරට ගීත සාහිත්‍යයට එක් විය. අද වනවිට සිංහල ගීතය මනා සේ තියුණු සාහිත්‍යාංගයක් බවට පත් ව ඇත.

1. ගීතයක් බිහි වන්නේ කුමන අංශ තුනෙහි මූලිකත්වයෙන් ද?
2. ඕනෑම රටක ගීත කලාවක් තිබීම මගින් ගම්‍ය වන්නේ කුමක් ද?
3. සිංහලයේ පැරණිතම ගී වන්නේ මොනවා ද?
4. මෙම ඡේදයේ සඳහන් තද්ධිත පදයක් හා මහාප්‍රාණ අක්ෂරයක් යෙදුණු වචනයක් ලියන්න.
5. පහත වචන සඳහා උචිත විරුද්ධ පද ඡේදයෙන් තෝරා ලියන්න.
   1. පුරාතන.
   2. අශිෂ්ට.

05. අ) යළි කොරෝනා රෝගීන්ගේ වැඩිවීමේ ප්‍රවණතාවක් පවතින බව කුරුණෑගල සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීන් විසින් කුරුණෑගල ප්‍රාදේශීය සම්බන්ධීකරණය කමිටු සාකච්ඡාවේ දී හෙළිදරව් කරන ලදී. නිවාසවලින් පිටතට යෑමේ දී මුඛ ආවරණ පැලඳීම, නිතර අත් සේදීමට හුරුවීම, කිව්සුම් යෑමේ දී ආරක්ෂාකාරී වීම, පොදු ස්ථානවල වැඩි වශයෙන් නොගැවසීමට කටයුතු කිරීම වැනි ක්‍රම යළිත් විධිමත් කළ යුතු බව වැඩිදුරටත් පැවසුවේ ය. මේ තොරතුරු අදාළ කරගෙන කුරුණෑගල නගරයේ ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාව සකස් කරන්න.

නැතහොත්

වීරපොකුණ සී.ඩබ්.ඩබ්. කන්නනගර විද්‍යාලයේ සාහිත්‍ය සංගමය මගින් එම විද්‍යාලයේ 11 ශ්‍රේණියේ සිසු දරුදැරියන්ගේ එක් දින අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කිරීමට කළ ඉල්ලීමට විදුහල්පතිතුමාගේ අනුමැතිය ලැබී ඇත. දෙමව්පියන් ගුරුභවතුන් කිපදෙනෙක් මෙම චාරිකාවට සහභාගි වනඅතර මෙම චාරිකාව සඳහා දෙමව්පිය කැමැත්ත ලිඛිත ව ලබා ගත යුතුව ඇත. මෙම චාරිකාව නුවරඑළිය ප්‍රදේශයේ ස්ථාන කීපයක් (තේ කර්මාන්ත ශාලාවක්, හග්ගල මල් වත්ත, අඹේවෙල කිරි නිෂ්පාදන ආයතනය දිය ඇලි 2 ක් ) නැරඹීමට අපේක්ෂා කරන අතර චාරිකාවේ අධ්‍යාපනික වටිනාකම, සංවිධානය පිළිබඳ තොරතුරු කාලසටහන ආදි විස්තර සැකෙවින් දක්වමින් දෙමව්පියන්ගේ කැමැත්ත ලබා ගැනීම සඳහා විදුහල්පතිතුමා මගින් දෙමව්පියන් වෙත යැවූ ලිපිය ලියන්න. ඔබ සාහිත්‍ය සංගමයේ ලේකම් හසිත සමරදිවාකර යැයි සිතන්න. වචන 100 ක් පමණ සෑහේ.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වඩමේල් මාකාණ කල්විත් තිණෛක්කළම් Department of Provincial Education - NWP

| 11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 21 S III |
|---|---|---|
| නම: ........................................... | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | කාලය පැය දෙකයි |

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේනම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01. I. "දේවයෙනි, මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නොදනුම්හ."
(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශයට සවන්දෙනු ලබන්නේ කවුරුන් ද?

II. පහත කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
යොදා සවන් වෙණ නද රස ........ සුලබව
නඳා එකඟ සිත් වත නොම ........ සකොබව
(අ) ...........................................................................................
(ආ) ...........................................................................................

III. "ගම්බද කඩ අසල එකතු වී සිටින පිරිස් ළිං ළඟ එකතු වී ඕපදූප කතා කරන ගැහැනු, මග යන එන මිනිස්සු යන සියල්ලෝ ම විමසුම් සහිතව ඈ දෙස බැලූහ."
(අ) ඉහත කොටස ඇතුළත් පාඩම කුමක් ද?
(ආ) ඉහත කොටසේ "ඈ" ලෙස දක්වා ඇති අයගේ නම කුමක් ද?

IV. (අ) හංස සන්දේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?
(ආ) 'රසවාහිනියෙහි' කැරගල හඳුන්වා ඇත්තේ කෙසේ ද?

V. පහත කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
මා කී දේ දෙයියනි බොරුවක් ම ........ නැති
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇති
(අ) ...........................................................................................
(ආ) ...........................................................................................

VI. (අ) සන්දේශ කාව්‍ය ඉතිහාසයේ පළමු වරට සන්දේශයක් රචනා කරන ලද්දේ කවුරුන් ද?
(ආ) සැළලිහිණි සන්දේශයේ දූත ආශිර්වාදය ලිය වී ඇත්තේ කුමන විරිතකින්ද?

VII. "මහණෙනි, මේ දෙකට ම නිස්ස කළෝ තුමුම ය."
(අ) ඉහත පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?

VIII. "මෙතෙක් දහස් සතුන් මරන තා ක්ෂාන්ති මෛත්‍රි යැ නොසිටි වන බැවින් තො නොසිටියා නම් වෙහි."
(අ) මෙම කොටස ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කා හට ද?

IX. සිංහල ජාතක කතා පොතෙහි දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
(අ) ...........................................................................................
(ආ) ...........................................................................................

X. (අ) "හානාහීය පානා අඩ හැරෙන් දැනේ." පාඩමේ අන්තර්ගත ජනකවි අයත් වන්නේ කුමන ජනකවි වර්ගයට ද?
(ආ) ශාන්තිකර්මවල දී දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමේ දී භාවිත කළ ජනකවි වර්ගයක් ලියන්න.

02. I. ආ, එහෙනම් අපට බෑ මෙහිදී මොකුත් කියන්ඩ'
(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද කා හටද?
(ආ) මෙම ප්‍රකාශයෙන් පසු එම පුද්ගලයා නැවත කළ ප්‍රකාශය කුමක් ද?

II. සන්නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
තැන් තැන් වලම සැතපී සියුමැලි බැවින
රන්වන් කරල් ගෙනැ එන ගිරවුන් අතින
යන්මන් තොසින් මඟ තොරතුරු නියම දැන

(අ) ඉහත පද්‍යයෙන් පැවසෙන ආකාරයට ගිරවුන්ගෙන් අසා දැන ගන්න යැයි පවසන්නේ කුමක් පිළිබඳව ද?
(ආ) එසේ පවසනු ලබන්නේ කා හටද?

III. ''කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ''
(අ) කොක් කරක් සේ දික් වූ කර ඇති වූයේ කුමන අයෙකුගේ ද? එසේ වීමට හේතුව කුමක් ද?
(ආ) මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

IV. <u>මිහ'ඹ</u> මුව මඩල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
කිරඹ <u>පොකුරු මී</u> රස ලැබ මොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) සමස්ත කවියේ අර්ථය ලියන්න.

V. 'යා හිමි, ම පුතු ගෙනැ එ'යි කිව.
(අ) මෙම ප්‍රකාශය සඳහා ලද පිළිතුර වූයේ කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කාරණය කෙටියෙන් විස්තර කරන්න.

03. I. අහිංසක දරුණු අපරාධකරුවෙක් බවට පත් වූයේ සමාජයේ බාහිර පාර්ශවයන්ගේ බලපෑම හේතුවෙනි.
II. සමාජයේ අනෙකුත් පුද්ගලයන්ගේ ජීවිත අඩාල වීමට මෙම අපරාධකරුවා ම හේතු විය.
එක් කොටසකට උදාහරණ දෙකක්වත් සපයමින් මෙම කියමන් විස්තර කරන්න.
**නැතහොත්,**
I. කාව්‍ය උපක්‍රම භාවිතයටත්,
II. විවිධ සමාජ ආර්ථික තොරතුරු හෙළි කිරීමටත්,
මග වැනුම්වලදී කවියා දක්වා ඇති සමත්කම එක් කොටසකට උදාහරණ දෙකක්වත් දක්වමින් විමසන්න.

04.I. තරුණයෙකුගේ අදහස් හා ක්‍රියාකාරිත්වයත්.
II. දරුවන්ගේ යහපත සඳහා ම ක්‍රියාකරන මවකගේ චරිතයත්,
නිරූපණයට සිංහබාහුගේ චරිතයත්, සුප්පාදේවියගේ චරිතයත්, යොදාගෙන ඇති ආකාරය සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටසින් එක් කොටසකට උදාහරණ දෙකක්වත් දක්වමින් සාකච්ඡා කරන්න.
**නැතහොත්,**
I. ගැඹුරු ජීවන දර්ශනයක් හෙළි කිරීමටත්,
II. අජීව පරිසරයට සජීව බව ආරෝපණය කිරීමටත්,
කාව්‍ය සංකල්පනා යොදාගත් ආකාරය ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයෙන් එක් කොටසකට උදාහරණ දෙකක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

05. ජනකවියේ ඇති අව්‍යාජත්වය කුරක්කන් කවි තුළින් මනාවට ප්‍රකට වේ. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

06. ජාතක කතාකරුවා භාෂා භාවිතයට දක්වා ඇති සමත්කම උම්මග්ග ජාතක කතාවේ ඔබට නිර්දිෂ්ට කොටද ඇසුරින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

07. ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස චරිත වෙනස් කිරීමට කතුවරයා දැක් වූ ප්‍රතිභාව ගුත්තිල කාව්‍ය සාර්ථක වීමට හේතුවක් විය. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.